මාව වට්ටන්න කාටවත් බැහැ

VINUDI PEIRIS

ජීවිතයේ අභියෝග හමුවේ නොසැලී, දැඩි කැපවීමෙන් හා ආත්ම විශ්වාසයෙන් තම සිහිනය යථාර්ථයක් කරගත් විනුදි පීරිස්, මෙවර Miss Diamond Queen International 2026 කිරුළ සමඟ ප්‍රධාන ශීර්ෂ (Titles) හයක්ම දිනා ගැනීමට සමත් වූවාය. තමන්ටම ආවේණික නර්තන කුසලතාවයෙන් ජයග්‍රහණය කළ ඇය, තුර්කියේ පැවැත්වෙන Miss Aura International 2027 තරගාවලියෙන් ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට සූදානම්. ඇය තැබූ ඒ අභිමානවත් පියවර සහ අත්දැකීම් LankaYouth Chat තුළින් මෙසේ ඔබ වෙත ගෙන එන්නෙමු.

විනුදි ලොකු ජයක් ලැබුවා නේද?

ඔව්. මගේ ජීවිතේ මම ලබපු වටිනා ජයග්‍රහණයක් මෙවර Miss Diamond Queen International Winner 2026 බවට මම පත් වීම. ඉදිරියේදී Turkeyවල පැවැත්වෙන Miss Aura International 2027 Pageant එකට මගේ රට නියෝජනය කරමින් තරග වදින්නට මම සූදානම් වෙමින් ඉන්නවා. මේ කිරුළ නිකන්ම කිරුළක් නෙමෙයි. හැබෑවුණ හීනයක්. මම ලබපු මේ ජයග්‍රණය ගැන මම නිහතමානීව සතුටු වෙනවා.
ඒ වගේම Miss Diamond Queen International pageant National Director දමිත් අන්ජු සර් සහ Team Manager ප්‍රශාදි චතුරිකා මිස් ඔවුන් දෙදෙනාගේ මග පෙන්වීමටත් බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා.

කොහොමද ඔයා තරගයට ඇතුළත් වෙන්නේ.

මට චූටි කාලේ ඉදලා Dream එකක් තිබුණා Crown එකක් win කරන්න. ඒ වගේම මම Modeling Actingවලට ආසයි. Miss Diamond Queen Audition Apply කරලා බැලුවා. මාව Audtionවලින් Select වුණා. එහෙම තමයි මම මේ තරගයට ඇතුලත් වුණේ.

තරගය අතරතුර ලැබුණු අත්දැකීම් සහ ඉගෙන ගත් දේවල්...

තරගය අතරතුර අත්දැකීම් බොහොමයක් ලැබුණා. තරගකාරිණියක් විදිහට අනිත් තරගකාරිණියන් සමග අන්‍යෝන්‍ය අවබෝධයකින් තරග කරන්න ලැබුණා. ඒ වගේම තරගයේ Mini Pageantsවලට තරග කරමින් ලොකු අත්දැකීමක් ලබාගත්තා.

Catwalk, Creativity & Artistic Expression, Time management, Confidence, Teamwork & Collaboration වගේ ගොඩක් දෙවල් ඉගෙන ගත්තා

ඔයා මොඩලින් ගැන තිබුණේ මොන වගේ දැනුමක්ද?

මම මේ මේ තරගයට ඇතුලත් වෙද්දී මට Modeling පිලිබදව මූලික දැනුමක් තිබ්බේ නෑ. මේ Pageant එක හරහා Modeling සම්බන්ධව විශාල දැනුමක් ලැබුණා.

ටැලන්ට් රවුන්ඩ් එකට කළ ඉදිරිපත් කිරීම ගැන හැමෝම කතා වෙනවා.

මම Talent round එකට ඉදිරිපත් කරේ Dancing Item එකක්. මම පායිම්පත් තියපු නර්තන ශිල්පිනියක්. ඉතින් මට පොඩි කාලේ ඉඳලම මටම ආවේනික වූ හැකියාව මම Talent Round එකට ඉදිරිපත් කරා Dancing Item එකක් ඇතුලේ Dancing Concept හතරක් ඉදිරිපත් කරා. උඩරට නර්තනය, උඩරට ගැට බෙර වාදනය, පහතරට පන්දම් පාලිය සහ ඉන්දියන් ඩෝල් වාදනය යන නර්තනාංග හතරම ඉදිරිපත් කරමින් ලස්සන තරගයක් දුන්නා.

පැජන්ට් එකේ ටයිටල් කිහිපයක්ම ජයගත්තා කියලා ආරංචියි.

Title හයක් ජයග්‍රහනය කළා. Miss Intelligence, Miss Popularity, Miss Super Talent, Most Creative costume, Miss Personality-1st Runner-up, Best Figure.

තරගයේදී ආපු බාධක ගැනත් කතා කරමුද?

ගැහැනු ළමයෙක්ට කිරුළක් දිනන්න හිතන තරම් ලේසි නෑ. හොද කැපවීමක්, ආත්ම විශ්වාසයක්, බුද්ධියක් තියෙන්න ඕනේ. විවිධ අය මේ ක්ෂේත්‍රය ගැන විවිධ දේවල් කියලා වට්ටන්න හදපු අවස්ථා තිබ්බා. මාව වට්ටන්න කාටවත් බෑ. මම මට ආව බාධක අත්දැකීමක් කරගෙන ජයග්‍රහණය වෙනුවෙන් තරග කරා.

මේ ජය ලබන්නේ විශ්වවිද්‍යාල සිසුවියක් විදිහට ඉන්න අතරේ.

ඔව් මම විශ්වවිද්‍යාල ඉගෙනීම් කටයුතු අතරතුර තමයි මේ තරගය ජයග්‍රණය කළේ.

විනුදිට මේ වැඩවලට සපෝර්ට් එක ලැබෙන්නේ කාගෙන්ද?

මට මම ඉන්නවා ඊට අමතරව පවුලේ අයගේ සහයෝගයත් තියෙනවා..

ඉස්සරහට මොනවද කරන්න බලාපොරොත්තු වෙන්නේ.

ඉදිරියේදී තුර්කියේ පැවැත්වෙන Miss Aura International 2027 Pgeant එකට මගේ රට නියෝජනය කරමින් තරග වදින්නට සූදානම් වෙනවා... ඒ සමගම නිරූපණ ක්ෂේත්‍රයේ ඉදිරියට යමින් විශ්ව විද්‍යාලයේ ඉගෙනීම් කටයුතු සමග ප්‍රධානම දේ ගුරුවරියක් වීමයි.

මේ තැබූ පියවර ගැන පවුලේ හිතවතුන් දරන්නේ මොන වගේ අදහසක්ද?

මම Miss Diamond Queen වීම මගේ පවුලට මම ලබාදුන් වටිනා ආඩම්බරයක් කියලා මම හිතනවා. මම ලබපු මේ ජයග්‍රහණය ගැන එයාලා ගොඩක් සතුටු වෙනවා...

ආදරය ගැන මොනවද හිතන්නේ...

ආදරය කියන්නේ වචන වලට වඩා හදවතට දැනෙන ලස්සන හැගීමක්. ආදරණීය පුද්ගලයෙක් සමග ආදරය ගොඩක් ආදරණීයයි..

දැනට ආදරවන්තියක්ද?

ඔව් මම ආදරවන්තියක්.

මේ ක්ෂේත්‍රයට එන්න ඉන්න නවක අයට මොන වගේ දෙයක්ද කියන්නේ.

ඔව් මේ ක්ෂේත්‍රය ගත්තහම හොඳ නරක දෙකම පවතිනවා ක්ෂේත්‍රයට එන්න ඉන්න නවකයින්ට කියන්න තියෙන්නේ බුද්ධිමත්ව කටයුතු කරොත් හොඳින් වැඩ කරගෙන යන්න පුලුවන් ක්ෂේත්‍රය හොදයි තමන්ගේ බුද්ධිය තමයි වැදගත්.

අනුර ප්‍රේමකුමාර

මෙවැනි ලිපියක් ලංකායූත් වෙබ් අඩවියේ පළකර ගැනීමට ඔබත් කැමැති නම් 0718 548 549 අංකයට කතා කරන්න.